සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සැකසුම - ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ර/ ඇඹි/ උඩවලව මහා විද්‍යාලය

| 8 ශ්‍රේණිය - සිංහල | තෙවන වාරය | තිස් වන සතිය |
|---|---|---|

17 පාඩම පරාස්ස ( පළමු කොටස)

සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් ලබා ගන්නා දැනුම අපගේ ජීවිත සාර්ථක ලෙස හැඩ ගස්වා ගැනීම සඳහා මනා පිටිවහලක් සපයයි. වර්තමානයේ ගද්‍ය හා පද්‍ය , නවකතා, කෙටිකතා, නාට්‍ය ආදි නිර්මාණාත්මක කෘති සියල්ල සාහිත්‍ය නිර්මාණ ලෙස දක්වා ඇත. පරාස්ස නාට්‍ය තුළින් යකුන් බැඳගෙන වැඩගත් ගැමියෙකු පිළිබඳ තොරතුරු දක්නට ලැබේ. තැනට සුදුසු ලෙස කටයුතු කිරීමෙන් තම අභිමතාර්ථ ඉටු කර ගත හැකි බව මෙම නාට්‍යයෙන් මනාවට පැහැදිලි වේ.

❖ පෙළ පොතේ පරාස්ස නාට්‍යය අධ්‍යයනය කර පහත සඳහන් අභ්‍යාස සම්පූර්ණ කරන්න

1) පරාස්ස නාට්‍යය නිෂ්පාදනය කිරීමට මූලික වූ ග්‍රන්ථය හා එහි කතුවරයා සඳහන් කරන්න .

2) මෙම නාට්‍යය රචනා කළේ කවුරුන්ද ?

3) පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කුමන අවස්ථාවේ ප්‍රකාශ කරන ලද්දක් ද යන්න සඳහන් කරන්න ?

   i. “ මං හිතුවා තිරාලලාගේ දිහා පැලවුණා කියලා”.
   ii. “ මු මොකද ? මේකා ද අද කුරක්කන් මල්ල ගෙනාවේ”.
   iii. ” ඇත්ත තමයි අර බලහල්ලකෝ බලු කුක්කෙක් වගේ හැංගිලා ඉන්න හැටි”.

4) මෙම නාට්‍යයේ ඔබ සිත් ගත් චරිතය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

5) පරාස්ස නාට්‍යයේ පස්වන කොටස පාඩමට ඇතුළත් කර ඇති නිසා සම්පූර්ණ නාට්‍ය සොයා රසවින්දනය කරන්න.